කොවිඩ්-19 මූලය සම්බන්ධයෙන් දිවයින පුවත්පතෙහි (03/31) දැක්වුණු ලිපියක සිරස්තලයේ, "කොරෝනා ආවේ සතුන් හරහා; WHO වාර්තාවකින් කියයි" යනුවෙන් දැක්වේ. කෙසේ නමුත් ලිපියේ අන්තර්ගතයේ සඳහන් වන්නේ, කොරෝනා වෛරසය මනුෂ්‍යයන්ට ආසාදනය වීම සිදුව ඇත්තේ සතුන් හරහා විය හැකි බව ලෝක සෞඛ්‍ය සංවිධානය සකස් කළ වාර්තාවකින් දැක්වෙන බවයි. එනම් කොවිඩ්-19 ආසාදනය පැමිණෙන්නේ සතුන් හරහා වග නිශ්චිත ලෙසින් එම වාර්තාවෙන් නොදැක්වෙයි.

එසේම මෙම ලෝක සෞඛ්‍ය සංවිධානයේ වාර්තාව පිළිබඳව සඳහන් කරනා ඇසෝසියේට් ප්‍රෙස් වාර්තාවේ සිරස්තලය වන්නේ "WHO report: COVID likely 1st jumped into humans from animals" ලෙසයි. එනම් එහිදීද සඳහන් වන්නේ බොහෝ දුරට මෙය සිදුවූවා විය හැකි නමුත්, එය නිශ්චිත නොවන බවයි.
එසේ ගත් විට, දිවයින සිරස්තලය කෙතරම් නිරවද්‍ය වන්නේද? ඒ පිළිබඳ ඔබේ අදහස කුමක්ද?

#MediaEthicsSL #lka #website #SinhalaPress #Divaina #AP